ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශාස්ත්‍රවේදී පළමු වසර ප්‍රථම අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2018 අගෝස්තු / සැප්තැම්බර්
ආර්ථික විද්‍යාව

# ECON 1110.3 / ECON 1110.03 – ක්ෂුද්‍ර ආර්ථික විද්‍යා මූලධර්ම

කාලය: පැය තුන (03) යි
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

01. i). හිඟකම යනු කුමක් ද? හිඟකම පවත්නා විට අවශ්‍යයෙන් ම තේරීම් කළ යුත්තේ ඇයි?

ii). ආවස්ථික පිරිවැය නිර්වචනය කර එය හිඟකම පිළිබඳ ප්‍රශ්නය සමඟ සම්බන්ධ වී ඇත්තේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

iii). ආර්ථික සම්පත් යනු මොනවාද? ඔබ ඒවා වර්ගීකරණය කරන්නේ කෙසේද?

iv). ශ්‍රම විභජනය නිෂ්පාදන පිරිවැය අඩු කිරීමට බලපෑ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(එක් කොටසකට ලකුණු 04)

02. i). ආර්ථික පද්ධතියක් යන්න නිර්වචනය කොට එහි කාර්යයන් පැහැදිලි කරන්න.

ii). විවිධ ආර්ථික පද්ධති විසින් කුමන භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය කරන්නේද යන ප්‍රශ්නය විසඳාගනු ලබන්නේ කෙසේද?

iii). සම්පත් කාර්යක්ෂමව බෙදාහැරීමෙහිලා වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය සෑම විටම සමත්වේද? පහදන්න.

iv). විධානගත ආර්ථිකයක් සහ වෙළෙඳපොළ ආර්ථිකයක් අතර දක්නට ලැබෙන වෙනස්කම් සඳහන් කරන්න.

(එක් කොටසකට ලකුණු 04)

03. i). නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් යනු කුමක්ද? එය අඳින්විට උපකල්පනය කරන දෑ නම්කරන්න.

ii). නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් විතැන්වීමට බලපාන සාධක කවරේද?

iii). නිෂ්පාදන කාර්යක්ෂමතාව සහ සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව අතර වෙනස දක්වන්න.

iv). පහත දැක්වෙන සිදුවීම් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක පෙන්නුම් කරන්න.

a. ආවස්ථික පිරිවැයකින් තොරව භාණ්ඩ නිෂ්පාදනය ඉහළයාම
b. කෘෂි නිමැවුම පහත වැටීම
c. සේවා නියුක්ත කළ හැකි ශ්‍රම ප්‍රමාණයේ ඉහළයාමක්
d. අලුතින් වඩාත් හොඳ පොහොර වර්ගයක් සොයාගැනීම

(එක් කොටසකට ලකුණු 04)

***********

04. පහත දැක්වෙන සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න.

a. පූර්ණ සේවා නියුක්තිය සහ පූර්ණ නිෂ්පාදනය
b. නිෂ්පාදක අතිරික්තය සහ පාරිභෝගික අතිරික්තය
c. බාල භාණ්ඩ සහ ගිෆන් භාණ්ඩ
d. අධි ඉල්ලුම සහ අධි සැපයුම

(එක් කොටසකට ලකුණු 04)

05. i). භාණ්ඩයක මිල ඉහළයන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩුවන්නේ ඇයිදැයි පැහිදිලි කරන්න.
(ලකුණු 06)

ii). ඉල්ලුම් වෙනස්වීම සහ ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වීම අතර වෙනස දක්වන්න.
(ලකුණු 06)

iii). භාණ්ඩයක් සඳහා රජය විසින් උපරිම මිලක් පැනවීමේ ආර්ථික ප්‍රතිවිපාක කවරේද?
(ලකුණු 04)

06. i). මිල ඉල්ලුම් නම්‍යතාව සහ ආදායම් ඉල්ලුම් නම්‍යතාව අතර වෙනස දක්වන්න. (ලකුණු 04)

ii). මිල ඉල්ලුම් නම්‍යතාව තීරණය කරන සාධක මොනවාද? (ලකුණු 04)

iii). මිල ඉල්ලුම් නම්‍යතා ප්‍රභේද කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

07. එක්තරා භාණ්ඩයක් සඳහා වූ වෙළෙඳපොළ ඉල්ලුම් සහ සැපයුම් ශ්‍රිත පහත සඳහන් සමීකරණවලින් දැක්වේ.

$$Qd = 500 - 20P$$
$$Qs = -200 + 15P$$

i. සමතුලිත මිල හා ප්‍රමාණය නිර්ණය කරන්න. (ලකුණු 04)

ii. සමතුලිත මිලේදී ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 02)

iii. රජය මෙම භාණ්ඩය සඳහා ඒකකයකට රුපියල් 10ක බද්දක් අය කලේ නම් නව සමතුලිත මිල හා ප්‍රමාණය නිර්ණය කරන්න.
(ලකුණු 03)

iv. ඒකක බද්දෙන් පාරිභෝගිකයා දරණ ප්‍රමාණය හා නිෂ්පාදකයා දරණ ප්‍රමාණය කොපමණද?
(ලකුණු 02)

v. ඒකක බද්ද නිසා පාරිභෝගික අතිරික්තයේ සහ නිෂ්පාදක අතිරික්තයේ සිදුවන වෙනස කොපමණද?
(ලකුණු 04)

vi. ශුද්ධ සුභසාධන බලපෑම කොපමණද? (ලකුණු 01)

***********